# 7 යුතුකම

### ඇස්. මහින්ද හිමි (1901-1951)

නූතන යුගයේ මුල් වකවානුවට අයත් කවීන් අතර ජාත්‍යාලය හා ජාතිකාභිමානය ඔප් නැංවීමෙහි ලා මහත් මෙහෙවරක් ඉටු කළා වූ කවියකු ලෙස සැලකෙන ඇස්. මහින්ද හිමියෝ ජාතික ආගමික පුනර්ජීවන ව්‍යාපාරයෙහි පුරෝගාමී චරිතයක් වූහ.



ළමා පරපුර කේන්ද්‍ර කර ගනිමින් නිදහස් හා නිවහල් චින්තනයක් ළමා මනස්හි ජනිත කරවමින් ජාත්‍යාලය වර්ධනයෙහි ලා තම කවි ශක්තිය මෙහෙයවූ මහින්ද හිමියෝ **කව්මිණි, කව්මුතු, ළමා කවි කළඹ** වැනි පොත් ද දරු නැලවිල්ල **හෙවත් ජාතික තොටිල්ල, නිදහස් මන්ත්‍රය, නිදහස් දැහැන, ලංකා මාතා** වැනි ග්‍රන්ථ ද රචනා කළහ.

කාලීන අවශ්‍යතා උදෙසා කවිය මෙහෙය වූ කොළඹ යුගයේ මුල් පරපුරේ බොහෝ කවීන් මෙන් ම උද්වේගකර වූ සෘජු බවක් හා ආවේග ශීලීත්වයක් මහින්ද හිමියන්ගේ නිර්මාණ වෙතින් ද ප්‍රකට වුව ද ඉතා සූක්ෂ්ම වූ නිසග කවීත්වයක්, ළමා පරපුර උදෙසා එ හිමියන් නිර්මාණය කළ ඇතැම් පද්‍යාවලින් පිළිබිඹු වනුයේ භාෂා භාවිතයේ අපූර්වත්වය ද ප්‍රකට කරමිනි. ජාත්‍යාලය වඩවනු වස් විශාල සමාජ වගකීමක් තමන් වෙත පවරා ගනිමින් කාව්‍යකරණයෙහි යෙදුණු උන්වහන්සේ තමන් විසූ යුගය තම කවිවල නිරූපණය කරමින් කාව්‍යකරණයෙහි නිමග්න වූවකු ලෙස සැලකිය හැකි ය.

උ ප   න් නෙත් මැරෙන්නෙත් තනියම යි      ලොවේ
එ යි   න් පිටත්තර වෙන විදියකින්      නොවේ
එ යි   න් එහෙම නම් තම යුතුකම      හමුවේ
බි යෙ න් තැති ගැනුම අපහට තරම්      නොවේ

නම් බුව කැමති අය ඇති නම් නො වී මුළා
ග ම් මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලො ම් සිදුරක තරම් වත් අඬ දබර නොලා
පි ම් මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට
ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉ ති න් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

ව ඳි න් නේ නැතිව ලොකු නිලධාරින් ට
ත ම න් ගේ බලය උරුමය රැක ගන් ට
හි ති න් වත් කැමති නම් එය කර ගන් ට
ඉ ති න් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අ ත ත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා
ක ත ත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අ යු ත් තකට අත් දෙක ඔසවන්ට එපා

අ පේ රට අපේ ජාතිය අපේ ගම
අ පේ අසල්වැසියා යන සියල් ලම
අ පේ අතට අවනත කර ගෙන වහම
අ පේ නමට සලකත දිවි දෙමු මෙහෙම

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමගි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලදාරින්ට විස්වාසය දෙන්ට එපා

## ලිඛිත අභ්‍යාස

1. යුතුකම පද්‍ය පන්තියේ භාෂා භාවිතය පිළිබඳ මහින්ද හිමියන් ගැන ඇගයීමක් කරන්න.
2. 'යුතුකම' පැදිපෙළ ඇස්.මහින්ද හිමි විසූ යුගයේ සමාජ අවශ්‍යතාවක් කුළු ගැන්වෙන පරිදි ලියැ වී ඇත. විමසන්න.
3. අදීන මිනිසෙකු ලෙස සමාජයේ ජීවත් වීමේ දී කෙනෙකු විසින් සිය සිතුම් පැතුම් හැඩගසා ගත යුතු ආකාරය යුතුකම පද්‍ය පංතියෙන් ඉදිරිපත් කෙරේ. පැහැදිලි කරන්න.
4. 'සිවුපද ආකෘතිය' සාර්ථකව යොදාගත් නිර්මාණයක් ලෙස යුතුකම පැදි පෙළ සැලකිය හැකිය. මේ ප්‍රකාශය නිදසුන් ඇසුරෙන් විමසන්න.